# කාර්ය සාධන වාර්තාව

## செயலாற்றுகை அறிக்கை

# Performance Report

## 2022

ජාතික අයවැය දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

தேசிய வரவுசெலவுத் திட்டத் திணைக்களம்
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசிய கொள்கைகள் அமைச்சு

Department of National Budget
Ministry of Finance, Economic Stabilazation and Economic Policies

**2022 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්ය සාධන වාර්තාව**
**ජාතික අයවැය දෙපාර්තමේන්තුව**
**වැය ශීර්ෂ අංකය - 240**

## පටුන


1 ආයතනික පැතිකඩ/ විධායක සාරාංශය ..... 4
1.1 හැඳින්වීම ..... 4
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු ..... 4
1.3 ප්‍රධාන කාර්යයන් ..... 5
1.3.1 ඉදිරි වර්ෂය සඳහා ජාතික අයවැය සකස් කිරීම ..... 5
1.3.2 පවත්නා වර්ෂයේ ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම ..... 5
1.3.3 අත්තිකාරම් ගිණුම් කටයුතු ..... 6
1.3.4 අයවැය යෝජනා සම්බන්ධයෙන් කටයුතු කිරීම ..... 6
1.3.5 වෙනත් කටයුතු ..... 6
1.4 සංවිධාන සටහන ..... 7
2 ප්‍රගතිය හා ඉදිරි දැක්ම ..... 8
2.1 අයවැය සංශෝධන 2022 ..... 8
2.1.1 පරිපූරක ඇස්තමේන්තු ..... 8
2.1.2 විසර්ජන පනතේ 7 වන වගන්තිය යටතේ ප්‍රතිපාදන අවුරා තැබීම ..... 8
2.1.3 2022 අංක 21 දරන විසර්ජන (සංශෝධන) පනත ..... 9
2.1.4 2022 අංක 42 දරන විසර්ජන (සංශෝධන) පනත ..... 9
2.1.5 පරිපූරක විශේෂ නීති වොරන්ට් බලපත්‍ර ..... 9
2.2 අත්තිකාරම් ගිණුම් කටයුතු ..... 10
2.3 විස්තරාත්මක කාර්ය සාධනය ..... 10
2.4 රාජ්‍ය වියදම් කළමනාකරණය ..... 16
2.4.1 ප්‍රතිපාදන මාරු කිරීම ..... 16
2.4.2 පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මගින් අමතර ප්‍රතිපාදන ලබාදීම ..... 16
2.4.3 රජයේ වියදම ..... 16
3 වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය (ජාතික අයවැය දෙපාර්තමේන්තුව) ..... 18
3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ..... 18
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ..... 19
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ..... 21
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් ..... 22
3.4.1 වාර්තා කිරීමේ පදනම ..... 22
3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය - අදාල නොවේ ..... 23

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය ........ 23
3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය ........ 24
3.8 විගණකාධිපතිවරයාගේ විගණන විමසුම් වාර්තාව ........ 24
**4 කාර්ය සාධන දර්ශක** ........ 25
4.1 රජයේ වියදම් දැරීම සම්බන්ධයෙන් 2022 වර්ෂයේ නිකුත් කළ චක්‍රලේඛ ........ 25
**5 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය** ........ 26
**6 මානව සම්පත් පැතිකඩ** ........ 27
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය ........ 27
6.2 මානව සම්පත් හිඟය සහ කාර්ය සාධනය ........ 27
6.3 මානව සම්පත් සංවර්ධනය ........ 27
**7 අනුකූලතා වාර්තාව** ........ 30
**8 ඇමුණුම - I** ........ 37

# 1 ආයතනික පැතිකඩ/ විධායක සාරාංශය

## 1.1 හැඳින්වීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ පාර්ලිමේන්තු පනත් වල ප්‍රතිපාදන යටතේ වන නෛතික රාමුවක් තුළ සහ මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ මගපෙන්වීම යටතේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ. රජයේ ප්‍රතිපත්ති රාමුව තුල සමස්ථ මධ්‍යකාලීන සාර්ව ආර්ථික රාමුවට අනුකූලව ආංශික මධ්‍ය කාලීන වියදම් රාමුවක් (MTEF) මත පදනම්ව අයවැය සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වියදම් කළමනාකරණය සඳහා අවශ්‍ය මඟ පෙන්වීම මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකරයි. මෙම ක්‍රියාවලියේ දී රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රජයේ ව්‍යවස්ථාපිත ආයතන සහ මහා භාණ්ඩාගාරයේ අනෙකුත් දෙපාර්තමේන්තු සමග නිරන්තර අන්තර් සම්බන්ධතාවයක් පවත්වාගෙන යනු ලබයි.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

රාජ්‍ය මූල්‍ය සම්පත් ඵලදායී සහ කාර්යක්ෂම ලෙස වෙන් කිරීම් හා කළමනාකරණය තුළින් සමාජ - ආර්ථික සංවර්ධනය

**මෙහෙවර**

පොදු භාණ්ඩ (Public goods) සහ තෝරාගත් සේවාවන් ඵලදායී ලෙස බෙදාහැරීම සඳහා රාජ්‍ය මූල්‍ය සම්පත් ඇස්තමේන්තුගත කිරීම සහ විසර්ජනය කිරීමෙන් රජයේ සංවර්ධන අරමුණු සාක්ෂාත් කිරීම.

**අරමුණු**

- මූල්‍ය සම්පත් කාර්යක්ෂම සහ ඵලදායී ලෙස ප්‍රතිපාදනය කිරීම
- මූල්‍ය විනය පවත්වා ගැනීම
- රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධතාවය තහවුරු කිරීම
- රාජ්‍ය ප්‍රතිපත්ති හා මූල්‍ය සීමාවන්ට යටත්ව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ වෙනත් රාජ්‍ය ආයතන සහ ව්‍යවස්ථාපිත ආයතන සඳහා වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

### 1.3.1 ඉදිරි වර්ෂය සඳහා ජාතික අයවැය සකස් කිරීම

ඉදිරි වර්ෂය සඳහා ජාතික අයවැය සකස් කිරීමට පහත සඳහන් කාර්යයන් සිදු කරනු ලැබේ.

- අනෙකුත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සමඟ සාකච්ඡා කර මධ්‍ය කාලීන අයවැය රාමුව (MTBF) නිමකිරීම සහ ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම
- අයවැය කැඳවීමේ චක්‍රලේඛය නිකුත් කිරීම
- වියදම් ඒකක සමඟ සාකච්ඡා කර කෙටුම්පත් ඇස්තමේන්තු සැකසීම
- වියදම් ඒකක සමඟ අයවැය සාකච්ඡා/උපදේශක රැස්වීම් මෙහෙයවීම
- අනෙකුත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තු ද විමසා ආදායම, වියදම, මූල්‍යකරණ (දේශීය හා විදේශීය) හා ණය ගැනීම් සීමාවන් පිළිබඳව තීරණය කිරීම
- විසර්ජන පනත් කෙටුම්පත සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේ කටයුතු නිම කිරීම
- විසර්ජන පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ හා නීති කෙටුම්පත් සම්පාදකගේ අනුමැතිය ලබා ගැනීම
- විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම
- විසර්ජන පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම
- විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම (පළමුවර කියවීම සඳහා)
- සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් කෙටුම්පත් අයවැය ඇස්තමේන්තු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
- විසර්ජන පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදයට සහභාගී වීම හා අනෙකුත් දෙපාර්තමේන්තුවල නියෝජිතයින් ද එම අවස්ථාවට සහභාගී වන බව තහවුරු කිරීම
- විසර්ජන පනත් කෙටුම්පතේ කාරක සභා අවස්ථාවේ සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
- අයවැය තෙවනවර කියවීමට සහභාගී වීම - කාරක සභා අවස්ථාවේ විවාදය
- වොරන්ට් බලපත්‍ර සකස් කිරීම සහ මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම
- වියදම් දැරීම සඳහා බලය ලබා දීමේ චක්‍රලේඛය නිකුත් කිරීම

### 1.3.2 පවත්නා වර්ෂයේ ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම

ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් කටයුතු සිදු කරනු ලැබේ.

- අයවැය ක්‍රියාත්මක කිරීමට බලය ලබාදීම ඇතුළත්ව අදාල උපදෙස් හා චක්‍රලේඛ නිකුත් කිරීම
- අනුමත ප්‍රතිපාදන සීමාවන් තුළ ප්‍රකාශිත අරමුණු වෙනුවෙන්ම එම මුදල් යොදාගැනෙන බව සහ මූල්‍ය විනය පවත්වාගෙන යනු ලබන බව තහවුරු කිරීම සඳහා පාලන විධික්‍රම බලාත්මක කිරීම.
- ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය තහවුරු කිරීම පිණිස වියදම් කිරීමේ ආයතන සමඟ එක්ව කටයුතු කිරීම.

- ප්‍රතිපාදන වෙන් කිරීමේ කාර්යක්ෂමතාවය අරමුණුකොට ගෙන ප්‍රමුඛතා අනුව ප්‍රතිපාදන නැවත වෙන් කිරීම (reallocation) හා මාරු කිරීම Transfer)
- "පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම්" ව්‍යාපෘතිය (TMV) කළමනාකරණය කිරීම

### 1.3.3 අත්තිකාරම් ගිණුම් කටයුතු

වාණිජ, ගබඩා සහ රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සඳහා සීමා නිර්ණය කිරීම සහ වියදම් කිරීමේ ආයතන වෙතින් ලැබෙන ඉල්ලීම් පදනම් කරගෙන එම ගිණුම් වල සීමා සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.


### 1.3.4 අයවැය යෝජනා සම්බන්ධයෙන් කටයුතු කිරීම

- අයවැය යෝජනා විශ්ලේෂණය කර වඩාත් සුදුසු ආයතන වෙත අදාල ප්‍රතිපාදන නිකුත් කිරීම හා අවශ්‍ය උපදෙස් නිකුත් කිරීම
- අවශ්‍ය පරිදි අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කිරීම, විශ්ලේෂණය කිරීම සහ අදාල ආයතන සම්බන්ධීකරණය කිරීම
- විශේෂ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම (වාහන ලීසිං / සුළු වැඩ වර්ජක දීමනා / යතුරු පැදි ලබා දීම වැනි)

### 1.3.5 වෙනත් කටයුතු

- පාර්ලිමේන්තුවේ අනුකාරක සභාවක් වන රාජ්‍ය මුදල් කාරක සභාවේ (COPF) රැස්වීම් අවස්ථාවල දී භාණ්ඩාගාරය නියෝජනය කරමින් ඒවාට සහය දැක්වීම
- පාර්ලිමේන්තුවේ අනුකාරක සභාවන් වන රාජ්‍ය ගිණුම් කාරක සභාවේ (COPA) සහ රාජ්‍ය ව්‍යාපාර කාරක සභා (COPE) රැස්වීම් අවස්ථාවල දී භාණ්ඩාගාරය නියෝජනය කරමින් ඒවාට සහය දැක්වීම
- ජාතික අයවැයට අදාල වන අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳව නිරීක්ෂණ සැකසීම
- පාර්ලිමේන්තු කාරක සභාවල දී සහ අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා විසින් කැඳවන රැස්වීම්වල දී භාණ්ඩාගාරය නියෝජනය කිරීම

## 1.4 සංවිධාන සටහන




| | | | | | |
|---|---|---|---|---|---|
| අ.ජ. | - අධ්‍යක්ෂ ජනරාල් | අති.අ.ජ. | - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | ගණකාධි | - ගණකාධිකාරී |
| අ | - අධ්‍යක්ෂ | නි.අ. | - නියෝජ්‍ය අධ්‍යක්ෂ | පරි.නි. | - පරිපාලන නිලධාරී |
| ස.අ. | - සහකාර අධ්‍යක්ෂ | ක.සේ.නි. | - කළමනාකරණ සේවා නිලධාරී | භා.ප. | - භාෂා පරිවර්තක |
| තො.තා.නි. | - තොරතුරු තාක්ෂණ නිලධාරී | ස.නි. | - සංවර්ධන නිලධාරී | කා.කා.ස. | - කාර්යාල කාර්යය සහයක |

# 2 ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2022 වර්ෂය තුළ දී ව්‍යවස්ථාපිතව නියම කර ඇති ක්‍රියාපටිපාටි අනුගමනය කරමින් 2023 ට අදාළ වන අයවැය සකස් කරන ලද අතර 2022 අංක 43 දරන විසර්ජන පනත මඟින් ඒ සඳහා අවශ්‍ය නෛතික බලය ලබා දී ඇත.

එම කටයුතු සිදුකරන අතරම 2021 අංක 30 දරන විසර්ජන පනත මගින් සම්මත කරන ලද 2022 අංක 21 හා 2022 අංක 42 දරන විසර්ජන (සංශෝධන) පනත් මගින් සංශෝධනය කරන ලද අයවැය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම සහ සහායන් ලබාදීම ද සිදුකරන ලදී.

## 2.1 අයවැය සංශෝධන 2022

පරිපූරක ඇස්තමේන්තු පාර්ලිමේන්තුවේ සම්මත කිරීමෙන් හෝ මුදල් අමාත්‍යවරයා විසින් පරිපූරක විශේෂ නීති වොරන්ට් බලපත්‍ර නිකුත් කිරීම මඟින් සංශෝධිත පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හෝ විසර්ජන පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීමෙන් පාර්ලිමේන්තුව විසින් යම් නිශ්චිත වර්ෂයක් සඳහා සම්මත කරනු ලබන සමස්ත වියදම සංශෝධනය කළ හැක.

2022 වර්ෂය සඳහා වන 2021 අංක 30 දරන විසර්ජන පනත 2021.12.10 දිනැතිව පාර්ලිමේන්තුවෙන් සම්මත විය. 2022 වර්ෂය තුල දී ඉහත සඳහන් සියලු ආකාරයන් තුලින් 2021 අංක 30 දරන විසර්ජන පනතේ සඳහන් සමස්ත වියදම සංශෝධනයට ලක්විය. විශේෂයෙන් පනත සඳහා සංශෝධිත පනත් කෙටුම්පත් දෙකක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර සම්මත කරන ලදී.

### 2.1.1 පරිපූරක ඇස්තමේන්තු

2022 වර්ෂය මැද වන විට පැවති සමාජ ආර්ථික අර්බුද හමුවේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය අතිශය අභියෝගාත්මක විය. විශේෂයෙන් අධික උද්ධමනය සහ ජීවනෝපාය මාර්ග පවත්වාගෙන යාමට එල්ල වූ බාධා හේතුවෙන් දුෂ්කරතාවයන්ට මුහුණ දුන් ජනතාව සඳහා සහන සැලසීම කෙරෙහි සම්පත් යෙදවීමට රජයට කටයුතු කරන්නට සිදුවිය. ඊට අමතරව, අධික මිල ඉහල යාම් හමුවේ වැඩි වූ රාජ්‍ය සේවා පවත්වාගෙන යාමේ වියදම් සඳහා ද ප්‍රතිපාදන සපයාගත යුතු විය. මෙම කරුණු පදනම් කරගෙන රු. බිලියන 695 ක පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන්නට සිදුවූ අතර එම පරිපූරක ඇස්තමේන්තුව 2022.06.08 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදුව එදිනම සම්මත විය

### 2.1.2 විසර්ජන පනතේ 7 වන වගන්තිය යටතේ ප්‍රතිපාදන අවුරා තැබීම

නව අවශ්‍යතා සඳහා ප්‍රතිපාදන සලසා ගැනීමට සමගාමීව රජයේ ආදායම ඉහළයාමක් අපේක්ෂා කළ නොහැකි වීම සහ අපේක්ෂිත ආදායම පවා රැස්කර ගැනීමට අසීරු වීම හේතුකර ගෙන විසර්ජන පනතේ 7 වන වගන්තිය මගින් මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ආණ්ඩුවේ අනුමැතිය ඇතිව ප්‍රමුඛත්වයෙන් අඩු කටයුතු ලෙස හඳුනාගත් රු. බිලියන 300ක ප්‍රතිපාදන අවුරා තැබීමට කටයුතු කරන ලදී.

### 2.1.3 2022 අංක 21 දරන විසර්ජන (සංශෝධන) පනත

2022 වර්ෂයේ මැද භාගයේ දී සිදුකළ අමාත්‍ය මණ්ඩල සංශෝධනය හේතුවෙන් අමාත්‍ය මණ්ඩලයේ ව්‍යුහය සහ අමාත්‍යාංශ විෂයපථයන් වෙන් කිරීම ප්‍රබල වෙනසකට ලක්විය. එවකට පැවති රාජ්‍ය අමාත්‍යාංශ සම්පූර්ණයෙන් අහෝසි වූ අතර ඇතැම් අමාත්‍යාංශ තවත් අමාත්‍යාංශ එකකට හෝ කිහිපයකට ඒකාබද්ධ විය. මේ හේතුවෙන් 2021 අංක 30 දරන විසර්ජන පනතේ සඳහන් වන ඇතැම් වැය ශීර්ෂවල වගකීම සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් පැන නැගුණ අතර, අමාත්‍යාංශ අහෝසි වීම සහ ඒකාබද්ධ වීම තුලින් ගිණුම්කරණ කටයුතු පවත්වාගෙන යාම ද ගැටළුකාරී විය.

මේ තත්ත්වය තුල අමාත්‍යාංශවල සුමට පැවැත්ම තහවුරු කිරීම සහ ගිණුම්කරණ කටයුතු පහසුවෙන් නිරවුල්ව පවත්වාගෙන යාම සඳහා 2021 අංක 30 දරන විසර්ජන පනත සංශෝධනය කිරීමේ දැඩි අවශ්‍යතාවයක් මතු විය. ඒ සඳහා විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පතක් සකස් කරන ලද අතර, එහිදී ඉහත 2.1.1 යටතේ දැක්වෙන පරිපූරක ඇස්තමේන්තුව සහ 2.1.2. යටතේ දැක්වෙන පරිදි අවුරා තබන ලද ප්‍රතිපාදන සඳහා අවශ්‍ය ගැලපීම් ද ඇතුලත් කරන ලදි.

එයට අමතරව, පැවතුන ආර්ථික තත්ත්වයන් තුල තවදුරටත් දැරීමට සිදුවූ අමතර වියදම් සඳහා ද ප්‍රතිපාදන ඇතුළත් කරන ලදි. එසේ සකස් කරන ලද විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත 2022.09.09 දින 2022 අංක 21 දරන විසර්ජන (සංශෝධන) පනත ලෙස පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදි.

### 2.1.4 2022 අංක 42 දරන විසර්ජන (සංශෝධන) පනත

2022 වර්ෂය තුල දේශීය ප්‍රාග්ධන වෙළඳපලේ පොලී අනුපාත පෙර නොවූ ලෙස ඉහළ යාමක් සිදු විය. එසේම, අපේක්ෂිත ආදායම් රැස්කර ගැනීමේ අසීරුතාවය හේතුවෙන් පරිණත වන භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර නිදහස් කිරීමට යළි භාණ්ඩාගාර බිල්පත් හෝ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමට සිදු විය.

උක්ත ණය උපකරණවල මුහුණත අගය මත ණය වාර්තාගත කරන බැවින් සත්‍ය වශයෙන් භාණ්ඩාගාරය වෙත ලැබෙන මුදලට වඩා වැඩි ප්‍රමාණයක් ණය වශයෙන් ගිණුම් ගත කිරීමට සිදු වේ. ඒ අනුව, 2022 වර්ෂය සඳහා පාර්ලිමේන්තුවෙන් සම්මත කරන ලද ණය ගැනීමේ සීමාව තුළ කටයුතු කිරීම අසීරු වූ බැවින්, ණය ගැනීමේ සීමාව රු. බිලියන 663 කින් වැඩි කර සංශෝධනය කර ගැනීම සඳහා යළිත් වතාවක් විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි. 2022 අංක 42 දරන විසර්ජන (සංශෝධන) පනත ලෙසින් එය 2022 නොවැම්බර් මස 30 වන දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදි.

### 2.1.5 පරිපූරක විශේෂ නීති වොරන්ට් බලපත්‍ර

විසර්ජන පනතේ 2 වන උපලේඛණයේ විශේෂ නීති සේවා ලෙස හඳුන්වා දී ඇති රජයේ වියදම් දැරීමට හැකිවනු පිණිස ඒකාබද්ධ අරමුදලින් මුදල් ලබා ගැනීමට බලය ලබාදෙමින් විශේෂ නීති සේවා බලපත්‍ර නිකුත් කිරීමට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් මුදල් අමාත්‍යවරයාට බලය ලබා දී ඇත. 2.1.2 වගුවේ සඳහන් කර ඇති කාර්යයන් සඳහා වන අතිරේක අරමුදල් අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස 2022 වර්ෂයේ දී මුදල් අමාත්‍යවරයා විසින් රු. බිලියන 251 ක් වටිනා එවැනි විශේෂ නීති සේවා බලපත්‍ර 02 ක් නිකුත් කර ඇත.

2.1.2 වගුව පරිපූරක විශේෂ නීති වොරන්ට් බලපත්‍ර

| අංකය | වැය ශීර්ෂ අංකය | ආයතනය | කාර්යය/අරමුණ | මුදල (රු) |
|---|---|---|---|---|
| 01 | 01 | අතිගරු ජනාධිපති | හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට 2022.07.14 සිට 2022.12.31 දක්වා විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම | 544,113 |
| 02 | 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | ණය සේවාකරණය වෙනුවෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන සඳහා වන ඌණතාවය | 251,000,000,000 |

## 2.2 අත්තිකාරම් ගිණුම් කටයුතු

තෝරාගත් බැංකු හරහා ක්‍රියාත්මක කරනු ලබන දේපල ණය හැර රජයේ නිලධාරීන් වෙත ලබාදෙන අත්තිකාරම් සහ වාණිජමය ස්වභාවයේ කටයුතු, අත්තිකාරම් ගිණුම යටතේ වන කටයුතු වලට ඇතුළත් වේ. 2022 වසරේ අත්තිකාරම් ගිණුම් කටයුතුවල ඇස්තමේන්තුගත උපරිම වියදම වන රු. බිලියන 29.19 ට සාපේක්ෂව සත්‍ය වියදම රු. බිලියන 19.14 ක් වන අතර ඇස්තමේන්තුගත අවම ලැබීම් සීමාව වන රු.බිලියන 23.19 හා සැසඳීමේ දී සත්‍ය ලැබීම් රු.බිලියන 19.40කි. ඒ අනුව, 2021 අංක 30 දරන විසර්ජන පනතේ අනුමත මුළු වියදම් සීමාවන් තුළ අත්තිකාරම් ගිණුම් කටයුතු සිදුකර ඇති වුව ද ඇස්තමේන්තුගත ලැබීම් සීමාව ළඟාකර ගැනීමට නොහැකි වී ඇත.

ප්‍රධාන වශයෙන් ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 මගින් මාණ්ඩලික නිලධාරීන්ට ණය පහසුකම් ලබාදීම 2022 වසර අවසන් වන තෙක් අත්හිටුවීම හේතුවෙන් 2021 වසර හා සසඳන විට අත්තිකාරම් ගිණුම් කටයුතුවල ක්‍රියාකාරීත්වයේ සියයට 4 ක අඩුවීමක් දක්නට ලැබිණි. එනම් 2021 වර්ෂයේ දී රු.බි.19.95ක් වූ ණය ලබාදීම් 2022 වර්ෂයේ දී රු.බි.19.14ක් දක්වා අඩු වී ඇත. ඇස්තමේන්තු සකස් කරන අවස්ථාවේ දී සිදු වූ අමාත්‍ය මණ්ඩල සංශෝධනය හේතුවෙන් එක් එක් වැය ශීර්ෂය යටතේ ඇති සේවක සංඛ්‍යාව නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකිවීම ද අත්තිකාරම් ගිණුම් කටයුතුවල කාර්ය සාධනයට අහිතකර ලෙස තවදුරටත් බලපා ඇත.

2021 අංක 30 දරන විසර්ජන පනතේ 8 වන වගන්තිය අනුව 2022 වර්ෂයේ සීමා සංශෝධනයන් අවශ්‍ය වූ අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම් ද ඇතුළුව) 35 ක් සඳහා 2023.03.22 දින පාර්ලිමේන්තු අනුමැතිය ලබාගෙන ඇත.

## 2.3 විස්තරාත්මක කාර්ය සාධනය

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| 1. 2021 අංක 30 දරන විසර්ජන පනත ක්‍රියාත්මක කිරීම සහ වියදම් කළමනාකරණය | වියදම් කළමනාකරණය පිළිබඳ උපදෙස් ලබා දෙමින් වියදම් සඳහා බලය ලබා දීමේ චක්‍රලේඛ නිකුත් කිරීම. | රාජ්‍ය වියදම් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම. | 2021.12.21 දිනැති අංක 03/2021 දරන ජාතික අයවැය චක්‍රලේඛය (2022 වර්ෂය තුළ වියදම් දැරීම සඳහා බලය දීම හා රාජ්‍ය වියදම් කළමනාකරණය) නිකුත් කරන ලදී. |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| | විසර්ජන පනතේ 5(1) වගන්තිය සහ මු.රෙ. 66 සහ මු.රෙ. 69 (වීරමොං ක්‍රියාපටිපාටිය) යටතේ ප්‍රතිපාදන මාරුකිරීම සඳහා බලය ලබාදීම. | අනුමත ඇස්තමේන්තු තුළ වියදම් කළමනාකරණය කර ගැනීම | ප්‍රතිපාදන මාරුකිරීම සඳහා වූ ඉල්ලීම් 1,556 ක් වෙනුවෙන් බලය ලබා දී ඇත. එයින් ඉල්ලීම් 166 ක් වැඩසටහන් අතර මාරු කිරීම සඳහා වන අතර 1,360 ක් ව්‍යාපෘති අතර මාරු කිරීම් සඳහා වේ. මාරු කිරීම් සඳහා වන ඉල්ලීම් 30 ක ට මු.රෙ. 69 යටතේ බලය ලබා දෙන ලදී. |
| | විසර්ජන පනතේ 6(1) වන වගන්තිය යටතේ ප්‍රතිපාදන නැවත විසර්ජනය කිරීම. | වියදම් කිරීමේ ආයතනවල මනා ක්‍රියාකාරීත්වය පිණිස ඒවායේ අතිරේක ප්‍රතිපාදන අවශ්‍යතාවන් ලබා දීම. | අනපේක්ෂිත සහ හදිසි ස්වභාවයේ වියදම් (උදා: වසංගත, ස්වාභාවික ආපදා) සහ වියදම් ඇස්තමේන්තුවල පැවති යම් යම් අපගමනයන් සපුරාලීම පිණිස වර්ෂය තුළ දී අතිරේක ප්‍රතිපාදන සඳහා වූ ලිපි 272 ක් වෙනුවෙන් රු. බිලියන 72.7 ක ප්‍රතිපාදන ලබා දෙන ලදී. |
| | පරිපූරක ප්‍රතිපාදන ලබාදීම පිළිබඳව පරිපූරක ඇස්තමේන්තු මාස දෙකකට වරක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම | විසර්ජන පනතේ ප්‍රතිපාදන අනුගමනය කිරීම | ලබා දුන් සියලුම පරිපූරක ප්‍රතිපාදන ආවරණය කරමින් වාර්තා 11 ක් ඉදිරිපත් කරන ලදී. |
| | 2021 අංක 30 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම | 2021 අංක 30 දරන විසර්ජන පනත සම්මත කරන අවස්ථාවේ පැවති අමාත්‍යාංශ ව්‍යුහය වෙනස්වීම අනුව අවශ්‍ය ගැලපුම් සිදුකිරීම හා අත්‍යාවශ්‍ය නව වියදම් දැරීමට අවශ්‍ය ප්‍රතිපාදන සැළසීම | 2022 අංක 21 දරන විසර්ජන (සංශෝධන) පනත |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| | 2022 අංක 21 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම | 2022 අංක 21 දරන විසර්ජන (සංශෝධන) පනතේ 2(1)(ආ) වගන්තිය යටතේ දක්වා ඇති ණය ලබාගැනීමේ සීමාවන් රු. බිලියන 663 ක් වැඩි කර සංශෝධනය කිරීම | 2022 අංක 42 දරන විසර්ජන (සංශෝධන) පනත |
| 2. 2023 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීම. | අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම. (අයවැය කැඳවීම) | සියලුම වියදම් කිරීමේ ආයතන විසින් මාර්ගෝපදේශ අනුගමනය කරමින් වාර්ෂික අයවැය සකස් කිරීම. | 2023 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ ඇතුළත් වූ අංක 05/2022 දරන චක්‍රලේඛය 2022.09.02 දින නිකුත් කරන ලදී. |
| | භාණ්ඩාගාරයේ අදාල දෙපාර්තමේන්තු හා වැය දරන ආයතන සමඟ සාකච්ඡා කර වාර්ෂික අයවැය ඇස්තමේන්තු කෙටුම්පත් සකස් කිරීම. | රජයේ ආර්ථික හා සංවර්ධන අරමුණුවල වාර්ෂික ඉලක්ක සපුරා ගැනීම තහවුරු කිරීම. | ගරු මුදල් අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පාර්ශවකරුවන් සමඟ පූර්ව අයවැය සාකච්ඡා පවත්වන ලදී. |
| | අදාළ අමාත්‍යාංශ සමඟ අයවැය සාකච්ඡා පැවැත්වීම. | වියදම් ප්‍රමුඛතාගත කරමින් නිසි මූල්‍ය කළමනාකරණය ක් හා මූල්‍ය විනයක් සහිතව අදාළ රාජ්‍ය මූල්‍ය ඉලක්ක ළඟා කර ගත හැකි පරිදි අයවැයක් සකස් කිරීම. | භාණ්ඩාගාර ලේකම්, නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරු හා අදාළ දෙපාර්තමේන්තු සහ ආයතන ප්‍රධානීන් සමඟ සමාලෝචන සාකච්ඡා පවත්වන ලදී. |
| | 2023 සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසීම. | විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. | 2023 වර්ෂය සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත 2022.10.05 දින ගැසට් පත්‍රයේ පළ කිරීම.<br><br>විසර්ජන පනත් කෙටුම්පත 2022.10.18 දින |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
| --- | --- | --- | --- |
| | | | පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. (පළමුවර කියවීම) |
| | | 2023 කාර්යයන් අනුව සකස් කරන ලද අයවැය ඇස්තමේන්තු මුද්‍රණය කිරීම සහ සවිස්තර ඇස්තමේන්තු සකස් කිරීම. | 2023 කාර්යයන් අනුව සකස් කරන ලද අයවැය ඇස්තමේන්තු නියමිත දිනට මුද්‍රණයකර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර සවිස්තර ඇස්තමේන්තු සකස් කර අන්තර්ජාලයට ඇතුළත් කර ඇත. |
| | | විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කිරීම. | 2022.11.14 දින අයවැය කතාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. (දෙවන වර කියවීම)<br><br>2022.11.15 සිට 2022.12.08 දක්වා අයවැය විවාදය පැවැත්වීම.<br><br>2022.12.08 දින පාර්ලිමේන්තුව මඟින් විසර්ජන පනත් කෙටුම්පත සම්මත කිරීම.<br><br>2022 අංක 43 දරන විසර්ජන පනත 2022.12.08 දින ගරු කථානායකතුමා විසින් අත්සන් කිරීම. |
| | ගරු මුදල් අමාත්‍යවරයා විසින් වොරන්ට් බලපත්‍ර නිකුත් කිරීම.<br><br>වියදම් කළමනාකරණය පිළිබඳ උපදෙස් ලබාදෙමින් බලය ලබාදීමේ චක්‍රලේඛය නිකුත් කිරීම. | වියදම් සඳහා බලය ලබාදීම. | ගරු මුදල් අමාත්‍යවරයා විසින් 2022.12.15 දින වොරන්ට් බලපත්‍ර නිකුත් කරන ලදී.<br><br>2023 වර්ෂය තුළ වියදම් දැරීම සඳහා බලය ලබා දීම සහ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳව උපදෙස් ලබා දෙමින් අංක 09/2022 සහ 2022.12.27 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලදී. |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| 3. අත්තිකාරම් ගිණුම් කටයුතු | අත්තිකාරම් ගිණුම් සඳහා වාර්ෂික සීමා නියම කරමින් විසර්ජන පනතේ උපලේඛණය සැකසීම<br><br>අවශ්‍යතාවය මත අත්තිකාරම් ගිණුම් සඳහා නියම කරන ලද සීමාවන් සංශෝධනය කිරීම | අත්තිකාරම් ගිණුම් කටයුතු සුමටව ක්‍රියාත්මක කිරීම | 2021 අංක 30 දරන විසර්ජන පනතෙහි III වන උපලේඛණය<br><br>වර්ෂය තුළ අත්තිකාරම් ගිණුම් 35 ක සීමා සංශෝධන සිදුකර, (2023.03.22 දින) අදාල සංශෝධන ඇතුලත් ශේෂ සම්මතයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. |
| 4. පාර්ලිමේන්තු කාරක සභා සඳහා සහාය දැක්වීම | රාජ්‍ය ගිණුම් කාරක සභාව, රාජ්‍ය ව්‍යාපාර කාරක සභාව සහ රාජ්‍ය මුදල් කාරක සභාව නියෝජනය කිරීම | පාර්ලිමේන්තු කාරක සභා සඳහා කැඳවීම් ලද විට දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් අවශ්‍ය සහභාගීත්වය ලබා දීම | කාරක සභා රැස්වීම් සඳහා කැඳවීම් සිදු කරන ලද සෑම කාරක සභා රැස්වීමක් සඳහාම නිලධාරියෙකු/ නිලධාරීන් සහභාගී වී ඇත. |
| 5. ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කළමනාකරණය. | පහත සඳහන් වාර්තා ඉදිරිපත් කිරීම.<br><br>(අ) දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව<br><br>(ආ) විසර්ජන ගිණුම<br><br>(ඇ) මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ වියදම් සමාලෝචනය පරිච්ඡේදය | නියමිත කාලයට පෙර වාර්තා ඉදිරිපත් කිරීම. | පහත වාර්තා නියමිත දිනට ඉදිරිපත් කරන ලදී.<br><br>(අ) කාර්ය සාධන වාර්තාව<br><br>(ආ) විසර්ජන ගිණුම 2022<br><br>(ඇ) වියදම් සමාලෝචනය 2022 |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| | හැකියා වර්ධනය | දේශීය හා විදේශීය පුහුණු මගින් මානව සම්පත් සංවර්ධනය. | විදේශීය ආයතන විසින් දායකත්වය සපයන ලද අන්තර්ජාලය ඔස්සේ පැවැත්වූ (අතථ්‍ය) විදේශ පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් 07 දෙනෙකු සහභාගී වී ඇති අතර ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ කාර්යයන් සඳහා අදාල වන පරිදි නිලධාරීන්ට දේශීය පුහුණු අවස්ථා ලබා දී ඇත. |
| | දෙපාර්තමේන්තු අත්තිකාරම් ගිණුම පාලනය කිරීම | අත්තිකාරම් ගිණුමේ සීමාවන්ට අනුකූලව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සෑම අයදුම්කරුවෙකුටම ණය අත්තිකාරම් ප්‍රදානය කිරීම | බලය ලබා දී ඇති සීමාවන් පිළිපදිමින් රු. 5,841,414.78 ක් වටිනා ආපදා ණය, පාපැදි ණය, විශේෂ අත්තිකාරම් සහ උත්සව අත්තිකාරම් ලබා දී ඇත. |
| | විගණන විමසුම්වලට ප්‍රතිචාර දැක්වීම. | විගණන විමසුම් අවම කිරීම. | විගණකාධිපති දෙපාර්තමේන්තුව මගින් එවන ලද සියලුම විගණන විමසුම් (විගණන විමසුම් දහයක් 10) සඳහා පිළිතුරු ලබාදෙන ලදි. |
| 6. විදේශීය සංවර්ධන පාර්ශවකරුවන්ට (ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව ආදී) පහසුකම් සැළසීම. | අවශ්‍ය අවස්ථාවල දී සංවර්ධන පාර්ශවකරුවන් සමඟ සාකච්ඡාවලට සහභාගී වීම. | සංවර්ධන පාර්ශවකරුවන් සමඟ අන්තර් සබඳතා පවත්වා ගැනීම. | අදාල අවස්ථාවල දී සංවර්ධන පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා පැවැත්වීම සඳහා භෞතිකව හෝ මාර්ගගතව සම්බන්ධ වී අවශ්‍ය කටයුතු සිදු කරන ලදී. |

## 2.4 රාජ්‍ය වියදම් කළමනාකරණය

### 2.4.1 ප්‍රතිපාදන මාරු කිරීම

පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද මුළු වියදම් සීමාව තුළ මුදල් රෙගුලාසිවල සඳහන් "වීරමොං පටිපාටිය"(Virement Procedure) යටතේ, උපයෝජනය නොකළ ප්‍රතිපාදන මාරු කිරීමට විසර්ජන පනතේ 5 වන වගන්තිය මඟින් ආයතනයන්ට අවසර ලබා දී ඇත. ඒ අනුව, 2022 වර්ෂය තුළ දී රු. බිලියන 313 ක වටිනාකමකින් යුතු එවැනි මාරු කිරීම් 1,556 ක් සඳහා මුදල් රෙගුලාසි 66 හා 69 යටතේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දී ඇත.

### 2.4.2 පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මගින් අමතර ප්‍රතිපාදන ලබාදීම

වැය දරන ආයතනයන් හි පුරෝකථනය කළ නොහැකි හදිසි හා අනපේක්ෂිත අරමුදල් අවශ්‍යතා සඳහා 2022 මුද්‍රිත අයවැය ඇස්තමේන්තුවල දක්වා ඇති විශේෂිත මාර්ගෝපදේශයන්ට අනුකූලව අතිරේක ප්‍රතිපාදන ලබාදීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුව මඟින් 2022 වර්ෂයේ දී ද වැය ශීර්ෂ 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

2022 වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුව මගින් රු. බිලියන 67.6 ක් වෙන්ව තිබූ අතර, 2022 වර්ෂයේ දී විවිධ වියදම් ඒකක සඳහා රු. බිලියන 72.7 ක අතිරේක ප්‍රතිපාදන ලබා දී ඇත.

2021 අංක 30 දරන විසර්ජන පනතේ අවශ්‍යතාවයන් සපුරාලමින් එසේ ලබාදුන් අතිරේක ප්‍රතිපාදන සම්බන්ධව වාර්තා වරින් වර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. 2022 වර්ෂයට අදාලව මෙවැනි වාර්තා 11 ක් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී. ඊට අමතරව 2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය (වගකීම්) කළමනාකරණ පනතට අනුව එම අතිරේක ප්‍රතිපාදන ලබාදීම් පිළිබඳ තොරතුරු මුදල් අමාත්‍යාංශ වාර්ෂික වාර්තාවේ ද ඉදිරිපත් කරන ලදී.

### 2.4.3 රජයේ වියදම

ණය ආපසු ගෙවීම් ද ඇතුළත්ව 2022 වර්ෂය තුළ සමස්ත රජයේ වියදම රු. බිලියන 5,986 ක් ලෙස වාර්තා වී ඇති අතර 2021 රු. බිලියන 4,879 ක් වූ අගය හා සැසඳීමේ දී සියයට 22.7 ක් එනම් නාමික අගය සැලකූ විට රු බිලියන 1,107 ක වැඩිවීමකි.

රජයේ මුළු වියදමින් සියයට 59 ක් එනම් රු. බිලියන 3,539 ක් පුනරාවර්තන වියදම් වේ. එය 2021 වර්ෂයේ දී මුළු පුනරාවර්තන වියදම වූ රු. බිලියන 2,757 ක් හා සැසඳීමේ දී 2022 වර්ෂය තුළ සියයට 28.3 ක වැඩිවීමකි. 2022 වර්ෂයේ මුළු මූලධන වියදම රු. බිලියන 2,447 ක් වන අතර එය 2021 වර්ෂයේ මුළු මූලධන වියදම වූ රු. බිලියන 2,122 හා සැසඳීමේ දී සියයට 15.3 ක වර්ධනයකි. මේ අතර 2021 වර්ෂයේ දී සියයට 43 ක් ව පැවති රජයේ මූලධන වියදම්වල උපයෝජන අනුපාතය 2022 දී තව දුරටත් දුර්වල වී සියයට 40.8 දක්වා කැපී පෙනෙන ලෙස අඩු වී ඇත.

**2.4.3 වගුව : වියදම් කාණ්ඩ අනුව රජයේ වියදම**

| | රුපියල් බිලියන | පුනරාවර්තන වියදමේ ප්‍රතිශතය | සමස්ත වියදමේ ප්‍රතිශතය |
|---|---|---|---|
| **මුළු පුනරාවර්තන වියදම** | **3,539.2** | **100** | **59.12** |
| මධ්‍යම රජයේ පුද්ගල පඩිනඩි | 712.9 | 20.14 | 11.91 |
| ගමන් වියදම් | 16.1 | 0.46 | 0.27 |
| සැපයුම් | 159.3 | 4.50 | 2.66 |
| නඩත්තු වියදම | 8.4 | 0.24 | 0.14 |
| සේවාවන් | 56.0 | 1.58 | 0.94 |
| මාරුකිරීම් (පළාත් සභා සහ රාජ්‍ය ආයතන වලට මාරුකිරීම් ද ඇතුළත්ව) | 1,021.1 | 28.85 | 17.06 |
| පොළී ගෙවීම් සහ වට්ටම් | 1,565.2 | 44.22 | 26.15 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 0.2 | 0.01 | 0.004 |
| | රුපියල් බිලියන | මූලධන වියදමේ ප්‍රතිශතය | සමස්ත වියදමේ ප්‍රතිශතය |
| **මුළු මූලධන වියදම** | **1,014.3** | **100** | **16.94** |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 18.8 | 1.86 | 0.31 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 74.5 | 7.35 | 1.25 |
| මූලධන මාරු කිරීම් | 120.9 | 11.92 | 2.02 |
| මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 438.7 | 43.25 | 7.33 |
| හැකියා ප්‍රවර්ධනය | 6.3 | 0.62 | 0.11 |
| වෙනත් මූලධන වියදම් | 355.0 | 35.00 | 5.93 |
| **රාජ්‍ය ණය ක්‍රමක්ෂය කිරීම** | **1,432.5** | | **23.93** |
| **සමස්ත වියදම** | **5,986.0** | | **100** |

# 3 වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය (ජාතික අයවැය දෙපාර්තමේන්තුව)

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| අයවැය 2022 රු. | | සටහන | තත්‍ය 2022 රු. | නැවත ගලපන ලද 2021 රු. | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | | | |
| - | ආදායම් බදු | 1 | | | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | | | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | | | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 909,850 | 2,910,000 | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **909,850** | **2,910,000** | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 264,438,000 | 410,292,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 100,677 | 21,396,032 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 11,094,209 | 16,157,388 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **275,632,886** | **447,845,420** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **276,542,736** | **450,755,420** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)** | | 2,788,183 | 355,051 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඈ)-(ඇ)** | | 273,754,553 | 450,400,369 | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | | | |
| 115,320,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 109,690,082 | 98,176,842 | ඒසීඒ-2(ii) |
| 98,700,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 68,183,852 | 43,517,457 | ඒසීඒ-2(ii) |
| 19,250,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 18,688,727 | 17,980,424 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | | | ඒසීඒ-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | | | ඒසීඒ-2(ii) |
| **233,270,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **196,562,661** | **159,674,723** | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මූලධන වියදම් | | | | |
| 1,500,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 1,375,400 | 709,749 | ඒසීඒ-2(ii) |
| 276,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 83,669,711 | 279,344,079 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 500,000 | හැකියා වර්ධනය | 14 | 327,676 | 663,200 | |
| - | වෙනත් මූලධන වියදම් | 15 | - | - | |
| **278,000,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **85,372,787** | **280,717,028** | |
| | තැන්පතු ගෙවීම් | | 245,579 | 32,128,384 | **ඒසීඒ-4** |
| | අත්තිකාරම් ගෙවීම් | | 11,219,831 | 10,612,288 | **ඒසීඒ-5** |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | | | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **11,465,410** | **42,740,672** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **293,400,853** | **483,132,423** | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | (19,646,304) | (32,732,054) | |
| | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය** | | (19,646,304) | (32,732,054) | **ඒසීඒ-7** |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | - | **ඒසීඒ-3** |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**ඒසීඒ - පී**

### 2022 දෙසැම්බර් 31 දිනට

### මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | සත්‍ය 2022 රු. | සත්‍ය 2021 රු. |
|---|---|---|---|
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | **ඒසීඒ-6** | 160,399,842 | 146,792,044 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | **ඒසීඒ- 5/5 (ඒ)** | 19,494,871 | 19,369,248 |

| | | | |
|---|---|---|---|
| මුදල් හා මුදල් සමාන දෑ | **ඒසීඒ -3** | - | - |
| **මුළු වත්කම්** | | **179,894,713** | **166,161,292** |
| **<u>ශුද්ධ වත්කම්/ ස්කන්ධය</u>** | | | |
| ශුද්ධ වත්කම් | | 19,494,853 | 19,224,328 |
| දේපළ, පිරියත හා උපකරණ සංචිතය | | 160,399,842 | 146,792,044 |
| කුලී වැඩ හා අත්තිකාරම් සංචිතය | **ඒසීඒ- 5 (ඕ)** | - | - |
| **<u>ජංගම වගකීම්</u>** | | | |
| තැන්පතු ගිණුම් | **ඒසීඒ-4** | 18 | 144,920 |
| අග්‍රිම ශේෂය | **ඒසීඒ-3** | | - |
| **මුළු වගකීම්** | | 179,894,713 | **166,161,292** |

පිටු අංක 7 සිට 47 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 48 සිට 55 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ................................ | ................ | ........................................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන් මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය :2023.02.24 | දිනය :2023.02.24 | දිනය :2023.02.24 |

කේ.එම්.එම්. සිරිවර්ධන
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

ජූඩ් නිලුක්ෂාන්
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අයවැය දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

2

[illegible] මුදිතා ගුණරත්න
ගණකාධිකාරී
ජාතික අයවැය දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

### 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2022 රු. | තත්‍ය නැවත ගලපන ලද 2021 රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 20,261,825 | 39,177,897 |
| අග්‍රිම ලැබීම් | 264,438,000 | 410,292,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 11,770,213 | 12,177,795 |
| තැන්පතු ලැබීම් | 100,677 | 21,396,032 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **296,570,715** | **483,043,724** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 177,278,244 | 141,026,699 |
| සහනාධාර සහ මාරුකිරීම් | 18,688,727 | 17,980,424 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 221,122 | (60,000) |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 2,788,183 | 355,051 |
| අත්තිකාරම් ගෙවීම් | 11,976,074 | 10,896,138 |
| තැන්පතු ගෙවීම් | 245,579 | 32,128,384 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **211,197,928** | **202,326,696** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **85,372,787** | **280,717,028** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | **-** | **-** |

| | | |
|---|---|---|
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 85,372,787 | 280,717,028 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **85,372,787** | **280,717,028** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(85,372,787)** | **(280,717,028)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඈ)+(ඊ)** | **-** | **-** |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **-** | **-** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **-** | **-** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | **-** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **-** | **-** |

# 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

## 3.4.1 වාර්තා කිරීමේ පදනම

1) <u>වාර්තා කරන කාලපරිච්ඡේදය</u>

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

**2) <u>මිණුම්කරණ පදනම</u>**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

**3) ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේ දී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

**4) දේපළ, පිරියත උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපල පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපල පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවල දී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

**5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

**6) මුදල් හා මුදල් සමාන දෑ**

2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

**7) මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම**

2022 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2021 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාල ගැලපුම් සිදුකර ඇත.

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය - අදාල නොවේ

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 233,270,000 | 233,270,000 | 196,562,661 | 84 |
| ප්‍රාග්ධන | 278,000,000 | 278,000,000 | 85,372,787 | 30 |

## 3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 2022.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ශේෂය | 2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තා අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණ යට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | - | - | - | - |
| 9152 | යන්ත්‍රෝපකරණ | 160,399,842 | 160,399,842 | | 100 |
| 9153 | ඉඩම් | - | - | - | - |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

## 3.8 විගණකාධිපතිවරයාගේ විගණන විමසුම් වාර්තාව

2022 වර්ෂය තුල දී විගණකාධිපති දෙපාර්තමේන්තුව මඟින් විගණන විමසුම් දහයක් (10) මෙම දෙපාර්තමේන්තුවට යොමු කර ඇති අතර ඒ සියල්ලටම නිසි පරිදි පිළිතුරු ලබා දී ඇත.

# 4 කාර්ය සාධන දර්ශක

## 4.1 රජයේ වියදම් දැරීම සම්බන්ධයෙන් 2022 වර්ෂයේ නිකුත් කළ චක්‍රලේඛ

2022 වසර සඳහා වූ අයවැය කථාව මඟින් 2022 වර්ෂයේ වියදම් දැරීම සඳහා වොරන්ට් බලපත්‍ර, කාර්තුමය වශයෙන් නිකුත් කිරීමට යෝජනා කරන ලදී. එසේ වොරන්ට් බලපත්‍ර නිකුත් කිරීම සහ බැඳීම් කළමනාකරණය පිළිබඳ උපදෙස් ලබාදෙමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

2022 වර්ෂයේ අයවැය සකස් කිරීමේ මාර්ගෝපදේශ ඇතුළත් චක්‍රලේඛයක් ද 2022 වර්ෂයට අදාළ විසර්ජන පනත මඟින් වෙන්කළ ප්‍රතිපාදන යටතේ වියදම් දැරීම සහ බලය ලබා දීම වෙනුවෙන් ද චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

සීමාකාරී රාජ්‍ය මූල්‍ය අවකාශය හේතුවෙන් රාජ්‍ය වියදම් ප්‍රශස්ථ අයුරින් කළමනාකරණය කිරීම උදෙසා අවස්ථානුකූලව ජාතික අයවැය චක්‍රලේඛ රාශියක් නිකුත් කරන ලදී.

### රාජ්‍ය වියදම් කළමනාකරණයට අදාළව නිකුත් කරන ලද චක්‍රලේඛ

| චක්‍රලේඛ අංකය | දිනය | විෂයය |
|---|---|---|
| NB/01/2022 | 2022.03.02 | රාජ්‍ය ආයතන විසින් මෙහෙයුම් කල්බදු පදනම යටතේ ලබාගත් වාහනවල ගිවිසුම් කාලය දීර්ඝ නොකිරීම |
| NB/02/2022 | 2022.04.01 | 2022 වර්ෂය තුළ වියදම් දැරීම සඳහා බලය දීම හා රාජ්‍ය වියදම් කළමනාකරණය - 2022 දෙවන කාර්තුව |
| NB/03/2022 | 2022.04.28 | රාජ්‍ය වියදම් පාලනය කිරීම |
| NB/04/2022 | 2022.06.30 | 2022 වර්ෂය තුළ වියදම් දැරීම සඳහා බලය දීම හා රාජ්‍ය වියදම් කළමනාකරණය - 2022 තෙවන කාර්තුව |
| NB/05/2022 | 2022.09.02 | අයවැය කැඳවීම - 2023 ( 2023-2025 මැදිකාලීන අයවැය රාමුව තුළ 2023 වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශ) |
| NB/06/2022 | 2022.09.21 | 2022 සංශෝධිත ඇස්තමේන්තු යටතේ වියදම් දැරීම සඳහා බලය දීම, 2022 වර්ෂය සඳහා වියදම් වාර්තාකරණය හා ගිණුම් තැබීම |
| NB/07/2022 | 2022.10.21 | මෙහෙයුම් කල්බදු පදනම යටතේ මිළදී ගත් වාහන කළමනාකරණය කිරීම |
| NB/08/2022 | 2022.11.25 | රජයේ ආයතන විසින් විවිධ උත්සව සඳහා දරනු ලබන වියදම් අත්හිටුවීම |
| NB/09/2022 | 2022.12.27 | 2023 වර්ෂය තුළ වියදම් දැරීම සඳහා බලය දීම හා රාජ්‍ය වියදම් කළමනාකරණය |

# 5 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම වනුයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුළු රාජ්‍ය ආයතන විසින් ඉටු කළ යුතු කාර්යයන් සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් ඇස්තමේන්තුගත කිරීම හා විසර්ජනය කිරීම වන බැවින් ඉලක්ක 17ක්, අරමුණු 169 ක් හා මූලික කාර්ය සාධන දර්ශක 244 ක් සහිත 2030 සඳහා වන තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සෘජුවම අදාළ නොවේ.

කෙසේවුවද, මූල්‍ය ප්‍රතිපාදන නොමැතිව අනෙකුත් ආයතනවලට තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගත නොහැකි බැවින්, සියළුම ඉලක්කයන් දෙපාර්තමේන්තුවට වක්‍රව අදාළ වන බව හඳුනාගෙන ඇත. ඒ අනුව, ජාතික අයවැය මඟින් එම ආයතන වෙත අරමුදල් ලබාදීමේ දී තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගත හැකි පරිදි අයවැයකරණ ක්‍රියාවලිය ප්‍රවාහ ගතකිරීමට දෙපාර්තමේන්තුව විසින් පියවර ගෙන ඇත. ඒ අනුව, 2022 අයවැය මඟින් ඒ ඒ ආයතන විසින් සිදුකරන ප්‍රධාන ව්‍යාපෘති කවර තිරසර සංවර්ධන අරමුණුවලට සම්බන්ධ ද යන්න දක්වා ඇති අතර තිරසර සංවර්ධන අරමුණුවලට අදාළ ඉලක්ක ඉටුකරගැනීමට හැකිවන පරිදි ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර ඇත.

තවද සමස්ථ අයවැය ප්‍රතිපාදන තිරසාර සංවර්ධන අරමුණු අතර බෙදාහැරීම හා අයවැය ප්‍රතිපාදන හා තිරසාර සංවර්ධන අරමුණු අතර ඇති සම්බන්ධතාවය හඳුනාගැනීමත් ඒ අනුව අනාගත අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී වියදම් ප්‍රමුඛතාවයන් හඳුනාගැනීමට උපකාරීවන පරිදිත් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි අනුග්‍රහකත්වය ඇතිව තිරසාර සංවර්ධන සභාව විසින් පරිගණක වැඩසටහනක් සකස්කරමින් පවතින අතර ඒ සඳහා අයවැය දෙපාර්තමේන්තුවේ සහයෝගය හා දායකත්වය ලබා දෙමින් පවතී.

# 6 මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / අතිරික්ත |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 37 | 28 | 09 |
| තෘතීයික | 04 | 04 | - |
| ද්විතීයික | 68 | 59 | 09 |
| ප්‍රාථමික | 34 | 28 | 06 |
| එකතුව | 143 | 119 | 24 |

## 6.2 මානව සම්පත් හිඟය සහ කාර්ය සාධනය

කාර්යය මණ්ඩලයේ හිඟය නිසා රාජකාරී කටයුතු ඉටුකිරීමේ දී දෙපාර්තමේන්තුවට දුෂ්කරතාවයන් වලට මුහුණ දීමට සිදුවේ.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම / ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| සිවිල් විශ්‍රාම වැටුප් ගණන් බැලීම සහ ගෙවීම | 01 | දින 02 | 7,500 | | දේශීය | කාර්යාලීය කටයුතුවලදී භාවිත කිරීමට මෙම දැනුම වැදගත් වේ. |
| රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 01 | දින 02 | 7,500 | | දේශීය | කාර්යාලීය කටයුතුවලදී භාවිත කිරීමට මෙම දැනුම වැදගත් වේ. |
| කාර්යාල කාර්ය සහායකයින් සහ රියදුරන්ගේ ආකල්ප හා වෘත්තීය දැනුම ඉහල නැංවීම | 03 | දින 02 | 25,500 | | දේශීය | ප්‍රාථමික මට්ටමේ නිලධාරීන්ට ප්‍රියමනාප කාර්යාල පරිසරයක් සකස් කිරීම සහ දැනුම ආකල්ප, කුසලතා වර්ධනය කිරීම. |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම / ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම | 01 | දින 01 | 5000 | | දේශීය | කාර්යාලීය කටයුතුවලදී භාවිත කිරීමට මෙම දැනුම වැදගත් වේ. |
| රජයේ වාහන නඩත්තු කිරීම | 01 | දින 01 | 5000 | | දේශීය | කාර්යාලීය කටයුතුවලදී භාවිත කිරීමට මෙම දැනුම වැදගත් වේ. |
| නිවාඩු භාර නිලධාරියාගේ කාර්යභාරය | 01 | දින 01 | 5000 | | දේශීය | කාර්යාලීය කටයුතුවලදී භාවිත කිරීමට මෙම දැනුම වැදගත් වේ. |
| පශ්චාත් උපාධි පාඨමාලාව (ව්‍යාපාර ගිණුම්කරණය) | 01 | 2021/2022 | 62,000 | | දේශීය | කාර්යාලීය කටයුතුවලදී භාවිත කිරීමට මෙම දැනුම වැදගත් වේ. |
| පුද්ගලික ලිපිගොණු කළමනාකරණය පිළිබඳ එක්දින වැඩමුළුව | 02 | දින 01 | 8000 | | දේශීය | කාර්යාලීය කටයුතුවලදී භාවිත කිරීමට මෙම දැනුම වැදගත් වේ. |
| රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය | 03 | මාස 03 | 9926 | | දේශීය | දෙමළ භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය |
| රජයේ කාර්ය සාධන කළමනාකරණය පිළිබඳ පොදුරාජ්‍ය මණ්ඩලීය මාර්ගගත පුහුණු වැඩසටහන (ආසියාවේ සංස්කරණය) | 01 | දින 05 | - | - | අතථ්‍ය විදේශීය | කාර්යාලීය කටයුතුවලදී භාවිත කිරීමට මෙම දැනුම වැදගත් වේ. |
| සාර්ව ආර්ථික පුරෝකථනය | 01 | දින 12 | - | - | අතථ්‍ය විදේශීය | ඇස්තමේන්තු සකස් කිරීමේ කටයුතුවලදී භාවිත කිරීමට මෙම දැනුම වැදගත් වේ. |
| මූල්‍ය වැඩසටහන්කරණය සහ ප්‍රතිපත්ති | 01 | දින 02 | - | - | අතථ්‍ය විදේශීය | කාර්යාලීය කටයුතුවලදී භාවිත කිරීමට මෙම දැනුම වැදගත් වේ. |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම / ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| රාජ්‍ය වියදම් කළමනාකරණය | 03 | දින 12 | - | - | අතථ්‍ය විදේශීය | ඇස්තමේන්තු සකස් කිරීමේ කටයුතුවලදී භාවිත කිරීමට මෙම දැනුම වැදගත් වේ. |
| රජයේ වැටුප් පද්ධතිය පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | දින 03 | 5,000 | - | අතථ්‍ය දේශීය | ගිණුම් සකස් කිරීමේ කාර්යාලීය කටයුතුවලදී භාවිත කිරීමට මෙම දැනුම වැදගත් වේ. |
| තිරසර සංවර්ධන ඉලක්ක ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ උපදේශන වැඩමුළුව | 01 | දින 01 | - | - | දේශීය | රාජකාරී කටයුතුවලදී භාවිත කිරීමට මෙම දැනුම වැදගත් වේ. |
| දෙමළ භාෂා ප්‍රවීණතාවය සඳහා වන පැය 200 රාජ්‍ය භාෂා පුහුණු වැඩසටහන | 02 | දින 26 | 30,000 | - | දේශීය | රාජකාරී කටයුතුවලදී භාවිත කිරීමට මෙම දැනුම වැදගත් වේ. |
| කණිෂ්ඨ විධායක නිලධාරීන් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමාව | 01 | සති 36 | 75,000 | - | දේශීය | රාජකාරී කටයුතුවලදී භාවිත කිරීමට මෙම දැනුම වැදගත් වේ. |

# 7 අනුකූලතා වාර්තාව

| අංක ය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළකවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | - | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.6 | වෙනත් | - | | |
| **2** | **පොත්පත් හා ලේඛණ නඩත්තු කිරීම** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛණ/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛණය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | |
|---|---|---|
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** |
| 2.8 | තොග ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** |
| 2.9 | හානි පාඩු ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** |
| 2.10 | බැරකම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** |
| 2.11 | උප පත්‍රිකා පොත් (GA-N20) ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූ.රෙ. 135)** | |
| 3.1 | ආයතනය තුළ මූල්‍ය බලතල පවරා දී තිබීම | **අනුකූල වේ** |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | **අනුකූල වේ** |
| 3.3 | සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | **අනුකූල වේ** |
| 3.4 | 2014.05.11 දිනැති අංක 17/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරුන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | **අනුකූල වේ** |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | **අනුකූල වේ** |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | **අනුකූල වේ** |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | **අනුකූල වේ** |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | **අනුකූල වේ** |

| | | |
|---|---|---|
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම | අනුකූල වේ |
| **5** | **විගණන විමසුම්** | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබේ | අනුකූල වේ |
| **6** | **අභ්‍යන්තර විගණනය** | |
| 6.1 | මු.රෙ. 134(2)DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ |
| 6.3 | 2018 අංක 19 දරන ජාතික විගනන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | |
| 7.1 | DMA චක්‍රලේඛ 1/2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ |
| **8** | **වත්කම් කළමනාකරණය** | |
| 8.1 | අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ |

| | | |
|---|---|---|
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර තිබීම | **අනුකූල වේ** |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | **අනුකූල වේ** |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | **අනුකූල වේ** |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | **අනුකූල වේ** |
| **9** | **වාහන කළමනාකරණය** | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | **අනුකූල වේ** |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | **අනුකූල වේ** |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කර තිබීම | **අනුකූල වේ** |
| 9.5 | 2016.12.29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | **අනුකූල වේ** |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | **අනුකූල වේ** |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | **අනුකූල වේ** |

| | | | | |
|---|---|---|---|---|
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් අතුළත නිරවුල් කර තිබීම | **අනුකූල වේ** | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | **අනුකූල වේ** | | |
| 11.2 | මු.රෙ.94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම | **අනුකූල වේ** | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට අනුකූල වීම | **අනුකූල වේ** | | |
| 12.2 | හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | **අනුකූල වේ** | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | **අනුකූල නොවේ** | - | ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නීති කටයුතු දෙපාර්තමේන්තු වේ උපදෙස් අපේක්ෂා කෙරේ |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | **අනුකූල වේ** | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | **අනුකූල වේ** | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | **අනුකූල වේ** | | |

| | | |
|---|---|---|
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාය ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | **අනුකූල වේ** |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | **අනුකූල වේ** |
| **15** | **ආදායම් ගිණුම** | |
| 15.1 | අදාල රෙගුලාසිවලට අනුකූලව රැස්කළ ආදායමින් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | - |
| 15.2 | රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කොට තිබීම | - |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | - |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | **අනුකූල වේ** |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | **අනුකූල වේ** |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | **අනුකූල වේ** |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛණයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** |

| | | |
|---|---|---|
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | **අනුකූල වේ** |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | **අනුකූල වේ** |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | **අනුකූල වේ** |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | **අනුකූල වේ** |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කර තිබීම | **අනුකූල වේ** |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලසුම තුළ තහවුරු කොට තිබීම | **අනුකූල වේ** |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | **මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ට අනුකූල වේ** |

| | | |
|---|---|---|
| 19.4 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | **අනුකූල වේ** |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | **අනුකූල වේ** |

# 8 ඇමුණුම - I

මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති මතය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ටීපීඩී/ඒ/එන්බීඩී/එෆ්ඒ/2022/11

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2023 මැයි 31 දින

ගණන්දීමේ නිලධාරී

ජාතික අයවැය දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 240 - ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශීර්ෂය 240 - ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

2

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන වේ.

3

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

2015 වර්ෂයේ අයවැය යෝජනාවක් වූ ක්ෂේත්‍ර නිලධාරීන් හට යතුරුපැදි ලබාදීමේ වැඩසටහනට අදාළව යතුරුපැදි සඳහා වූ මූලික ගෙවීම, බදු නොවන ආදායමක් ලෙස දෙපාර්තමේන්තුව විසින් 2003.04.00 දරන ආදායම් සංකේතාංකයට ගිණුම්ගත කර තිබූ අතර එසේ ලබා දුන් සියළුම යතුරුපැදි 2020 වර්ෂය අවසාන වන විට අදාළ නිලධාරීන්ගේ පෞද්ගලික අයිතියට පැවරී අවසාන විය යුතුව තිබුණි. එසේ වුවද එම වැඩසටහනට අදාළව මූලික ගෙවීම ලෙස රු.909,850 ක ශුද්ධ ආදායමක් 2022 වර්ෂය තුළදීත් ලැබී තිබුණි. ඒ අනුව අදාළ අයවැය යෝජනාව ක්‍රියාත්මක කර අවසන්ව තිබියදීත්, ඊට අදාළ විධිමත් උපදෙස් ලබා දෙමින් ගිණුම්ගත කිරීම අවසන් කර නොතිබුණි.

### 2.2. වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වැය විෂයන් 6 ක් හා මූලධන වැය විෂයයන් 3 ක් වෙනුවෙන් අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 22 ක සිට සියයට 70 ක් අතර පරාසයක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි.

(ආ) 2102 වැය විෂයය යටතේ ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදීගැනීමට සමාලෝචිත වර්ෂය තුළ ද උක්ත වැය විෂයයට අදාළව රු.4,000,000 ක වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදනයක් වෙන් කර තිබූ අතර, ඉන් වර්ෂය අවසානයේ සියයට 39 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

### 2.3 අත්තිකාරම් ගිණුම්

#### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

2015 සැප්තැම්බර් 23 දින සිට සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.150,119 ක ණය ශේෂය 2022 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් වී නොතිබුණි.

### 2.4 බැරකම් හා බැඳීම්වලට එළඹීම

මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි (ඇමුණුම iii) 240-1-1-0-1101 යටතේ දක්වා තිබූ බැරකම් වටිනාකම රු.28,117 ක් පමණක් වුවත්, විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ සමාලෝචිත වර්ෂයට අදාල රු.38,128 ක් වූ බැරකම්, බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා නොතිබුණි.

4

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2022 හි 10 ඡේදය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා වෙත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ද ඉදිරිපත් කළ යුතු වුවද, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2023 පෙබරවාරි 28 දින වන විට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 අංක 30 දරන විසර්ජන පනතේ තෙවන උපලේඛනය යටතේ වන අත්තිකාරම් කාර්යයන් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් අනුමත කළ පහත විස්තර සඳහන් සීමාවන් භාණ්ඩාගාර පොත් අනුව පිළිපැද නොතිබුණු අවස්ථා අනාවරණය විය. පනතේ 8(1)(ආ) වගන්තිය ප්‍රකාරව 2023 මැයි 31 දින වනවිට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර එම සීමාවන් සංශෝධනය කර ගත යුතුව තිබුණත්, 2022 මැයි 19 දින වන විටත් එම සීමාවන් සංශෝධනය කර ගත් බව තහවුරු කිරීමේ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(i) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් කාර්යයන් 02 කට අදාළ උපරිම වියදම් සීමාව එකතුව රු.602,888 කින් ඉක්මවා වියදම් කර තිබුණි.

(ii) විෂය අංක 31002 - රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ කළ වැඩ අත්තිකාරම් ගිණුමේ උපරිම වියදම් සීමාව රු.76,900,472 කින් ඉක්මවා රු.196,900,472 ක් වැය කර තිබුණි.

(ආ) ජාතික අයවැය දෙපාර්තමේන්තුව මඟින් අධීක්ෂණය කරනු ලබන ආයතන 117 ට අදාල ක්‍රියාකාරී සැලැස්මේ හෝ ක්‍රියාකාරකම්හි 2022 දෙසැම්බර් 31 දිනට කාර්යසාධනය අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

5

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**3.2** 1980 ජුලි වැඩ වර්ජනයට සහභාගී වී රැකියා අහිමිවූවන්ට සහන සැලසීම

1980 ජුලි වැඩ වර්ජනයට සහභාගී වී රැකියා අහිමිවූ ස්ථිර ජීවනෝපාය මාර්ගයක් නොමැති වූ වයස අවුරුදු 65 සම්පූර්ණ වූ පුද්ගලයන්ට සහන සැලසීම සඳහා දීමනාවක් ලබාදීමට අයවැය යෝජනා මගින් 2013 වර්ෂයේ සිට අනුමත වී තිබුණි. ඒ අනුව 2013 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දක්වා මසකට රු.5,000 බැගින් ද, 2015 ජනවාරි 01 දින සිට 2015 දෙසැම්බර් 31 දක්වා මසකට රු.6,000 බැගින් ද, 2015 දෙසැම්බර් 31 දිනෙන් පසුව එක්වරක් පමණක් ගෙවනු ලබන රු.250,000 ක දීමනාවක් ද ලබා දීමට අයවැය යෝජනා ක්‍රියාත්මක වී තිබුණි. නමුත් දෙපාර්තමේන්තුව මේ සඳහා හිමිකම් ලබන්නන් නිශ්චිත වශයෙන් හඳුනා ගැනීමක් සිදුකර නොතිබුණි. මෙම තත්ත්වය දිගින් දිගටම විගණනය විසින් පෙන්වා තිබුණ ද ඒ සම්බන්ධව මේ දක්වා පැහැදිලි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වෙතත්, 2022 වර්ෂය තුළදී ප්‍රතිලාභීන් 69 දෙනෙකු සඳහා එක්වරක් පමණක් ගෙවනු ලබන දීමනාව වූ රු.250,000 බැගින් රු.17,250,000 වටිනාකමින් යුතු මුදලක් ගෙවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි.

**3.3** **වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 ජුනි 11 දින මුදල් අමාත්‍යාංශය විසින් ගිලන් රථ 50 ක්, වතුර බවුසර් 50 ක් හා ඩබල් කැබ් රථ 50 ක් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබූ සංදේශයට 2021 ජුනි 29 දින අනුමැතිය ලබා දී තිබුණි. ඒ සමඟ නොමිලේ ලබා දීමට එකඟ වී තිබූ වතුර බවුසර් 02 හා ඩබල් කැබ් රථ 12 ද මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ මිලදී ගැනීමට 2021 ජුලි 28 දින ඉදිරිපත් කර තිබූ සංදේශයට 2021 අගෝස්තු 18 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව, ගිලන් රථ 50 ක්, වතුර බවුසර් 52 ක් හා ඩබල් කැබ් රථ 62 ක් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ 2021 වර්ෂයේදී මිලදී ගෙන තිබුණි. ඒ අනුව 2021 වර්ෂය අවසානය වන විට මෙම වාහන 164 ආනයනය කර තිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනවන විට ඉන් වාහන 76ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබූ අතර වාහන 51ක් වාහන අවශ්‍ය කරන ආයතන වෙත භාර දී තිබුණි. විස්තර පහත පරිදි වේ.

6

| වාහන වර්ගය | 2021 වර්ෂය තුල | | 2022 වර්ෂය තුල | |
|---|---|---|---|---|
| | ලියාපදිංචිය සම්පූර්ණ කළ වාහන සංඛ්‍යාව | ආයතන වෙත පවරා දුන් කාලපරිච්ඡේදය | ලියාපදිංචිය සම්පූර්ණ කළ වාහන සංඛ්‍යාව | ආයතන වෙත පවරා දුන් කාලපරිච්ඡේදය |
| ගිලන් රථ | 25 | 00 | 25 | 50 |
| කැබ් රථ | 51 | 51 | 11 | 11 |
| වතුර බව්සර් | 00 | 00 | 52 | 52 |
| එකතුව | 76 | 51 | 88 | 113 |

තවද යථාරූපී සංකල්පය අනුව ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තා කිරීමේදී නීතිමය අයිතිය කුමක් වුවත්, වත්කම ආර්ථික ප්‍රතිලාභ අත්කර දෙන්නේ නම් එහි ප්‍රායෝගික යථාර්තය පදනම් කර ගත යුතු අතර අනාවරණ සංකල්පය අනුව මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමේදී අදාළ කාලපරිච්ඡේදයට අයත් සියලු තොරතුරු, මූල්‍ය වාර්තා පරිහරණය කරන පාර්ශවයන්ට අනාවරණය කළ යුතුය. එසේවෙතත් මෙම වාහන 164හි එකතු වටිනාකම රු.1,693,839,615 ක් 2022 වර්ෂයේ මූල්‍ය කල්බදු යටතේ මිලදී ගෙන තිබූ වත්කම් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම් ගත කර තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් වාහන අවශ්‍ය කරන ආයතන වෙත එම වාහන පවරා දීමට කටයුතු කර ඇති බව දන්වා තිබුනද ආයතන 15 ක් විසින් එම වාහන භාරගත් බවට ලිඛිත සාක්ෂියක් හෝ විගණනය වෙත ඉදිරිපත් නොවිනි.

**3.4 පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් වැය විෂයය**

(අ) සමාලෝචිත වර්ෂය තුළ වෙනත් වියදම් ශීර්ෂ වෙත ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් වැය විෂයය යටතේ පුනරාවර්තන වියදම්වලට අදාළව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 81 කට අදාළව නිකුත් කර තිබූ ප්‍රතිපාදනයන්ගෙන් එකතුව රු.23,424,731,937 ක් වුවත්, ACA-2(ඒ)(ii) ආකෘතියෙහි එම වටිනාකම රු.23,092,547,937 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව, ලබා දුන් ප්‍රතිපාදනයේ රු.332,184,000 ක නොසැසඳීමක් විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් ACA-2(ඒ)(ii) හා ACA-2(ඒ) (iv) ආකෘතීන් අනුව ආයතන වෙත පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් වැය විෂයය යටතේ ලබා දුන් පුනරාවර්තන හා මූලධන ප්‍රතිපාදනයේ වටිනාකම් පරිපූරක ඇස්තමේන්තුව සමඟ සැසඳීමේදී ප්‍රතිපාදනයන් ලබා දී තිබූ ආයතනයන්හි වෙනස්කම් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| ACA-2(ඒ)(ii) ආකෘතිය අනුව ප්‍රතිපාදන ලබා දුන් ආයතනය | පරිපූරක ඇස්තමේන්තු අනුව ප්‍රතිපාදන ලබා දුන් ආයතනය | ලබා දී තිබූ ප්‍රතිපාදන මුදල (රු.) | බල අංකය |
|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | | |
| • වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 55,000,000 | 155 |
| • වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 314,312 | 175 |
| **මූලධන වියදම්** | | | |
| • ශ්‍රී ලංකා නාවික හමුදාව | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය | 486,000,000 | 260 |

(ඈ) පරිපූරක ඇස්තමේන්තු බල අංකය 123 යටතේ පුනරාවර්තන ප්‍රතිපාදන රු.3,000,000 ක් හා මූලධන ප්‍රතිපාදන රු.5,000,000 ක් ලෙස වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණි. නමුත්, මූල්‍ය ප්‍රකාශන තුළ ACA-2(ඒ)(ii) හා ACA-2(ඒ) (iv) ආකෘතීන් අතර පුනරාවර්තන ප්‍රතිපාදනය රු.5,000,000 ක් ලෙසත් මූලධන ප්‍රතිපාදනය රු.3,000,000 ක් ලෙසත් සඳහන් කර තිබුණි.

**3.5 හානි/ පාඩු**

සමාලෝචිත වර්ෂය තුළ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් පොත්වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශයෙහි (ඇමුණුම ii) හි සඳහන් වර්ෂය තුළ මු.රෙ. 109 යටතේ වන පොතෙන් කපාහැරීම් හා අය කර ගැනීම් යටතේ 2022 වර්ෂය තුළ අවස්ථා 3 කදී සිදු වී තිබූ රු.100,700 ක හානි හා එක් අවස්ථාවකට අදාලව වූ රු.42,000 ක අයකර ගැනීම් පිළිබඳ තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

**4. මානව සම්පත් කළමනාකරණය**

2022 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 08 ක් ද, ද්විතික මට්ටමේ තනතුරු 09 ක් ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 06 ක් ද ලෙස එකතුව පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 23 ක් පැවතුණි.

බී.ඕ.ඩී.ප්‍රනාන්දු
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

8